**KANDYAN DANCE III**
**The Open University | Open Create Learn**
**By Dilini Seneviratne**

## GAHAKA VANNAMA
## The Conch Shell

| | |
|---|---|
| සක් බඹ ඉසුරු එවිස්කම් කරන-ම | Sak Bamba Isuru Ewiskam Karana-ma |
| සක් සින්නම් වීනාවය ගෙන සෑ-ම | Sak Sinnam Veenawaya Gena Sae-ma |
| සක්විති රජහට ඉසුරිඳු කළ මෙ-ම | Sakwithi Rajahata Isurindu Kala me-ma |
| සක් නදයෙන් සැදි ගාහක වන්න-ම | Sak Nadayen Sedi Gahaka Vanna-ma |

## GAJAGA VANNAMA
## The Elephant

| | |
|---|---|
| දෙව්පුර ඇතෙකී – කුඹු දහසයකී | Devpura Etheki – Kumbu Dahasayaki |
| දිග දළ අටෙකී – සත් ගැබකී | Diga Dala Ateki – Sath Gebaki |
| වැව් පොකුණු ද කී – සත් සිය ගැන කී | Vew Pukunu Da Ki – Sath Siya Gena ki |
| එක පොකුණෙකී – සිවු මලෙකී | Eka Pokuneki – Sivu Maleki |
| සිවු මල පෙති කී – ගැන තිස් දෙකකී | Sivu Mala Pethi ki – Gena Tis Dekaki |
| පෙත්තක නටු කී – සිවු සැටෙකී | Peththaka Netu ki – Sivu Sate ki |
| කව් කර වැනුකී – ලෙවු ඉසි බසෙකී | Kav Kara Venuki – Levu Isi Baseki |
| ගජගා නමකී – වන්නමකී | Gajaga Namaki – Vannamaki |

# ASADRUSHA VANNAMA
## Praising the Buddha

| | |
|---|---|
| මුනිඳුන් දම් සඟ සැරියුත් වැඳගනිමින් | Munindun Dam Sanga Seriyuth Vendaganimin |
| සැම ඇති දොස හැර බිඳ මෙවදන් | Sema Ethi Dosa Hera Binda Mevadan |
| ඉසි බස ලෙස නිවරද පවසන්නෙමි සබයේ | Isi Basa Lesa Nivarada Pavasannemi Sabaye |
| සුරිඳුන් විස්කර්ම පළමු පද සතරින් | Surindun Wiskarma Palamu Pada Satarin |
| ඉසුරිඳු හැට හතරද ගදඹුන් | Isurindu Heta Hatharada Gadambun |
| වැයු දෙසිය සොලොස් පද එනමෙන් දිව පුරයේ | Veyu Desiya Solos Pada Enamen Diva Puraye |
| නිරිඳුන් සම්මත මුල පටුනද දකිමින් | Nirindun Sammatha Mula Patunada Dakimin |
| සුරවර බැස මෙලොවද කෙරුවෙන් | Surawara Besa Melovada Keruven |
| දෙලොවෙහි විය සඳු සඳ ගනිමින් නැත මතයේ | Delovehi Viya Sanda Ganimin Netha Mathaye |
| රඟදුන් සැටි වී පිරියද යෙදුවෙන් | Rangadun Seti Vee Piriyada Yeduven |
| පිළිවෙල ඉසි නාරද ස්වරයෙන් | Pilivela Isi Narada Swarayen |
| ගණනින් ඇති තාලද වන්නම අසදෘශයේ | Gananin Ethi Thalada Vannama Asadrushaye |

# UDARA VANNAMA
## Majesty of The King

| | |
|---|---|
| සදා බරණ පලදා සිවු සැට කී – පුර | Sada Barana Palanda Sivu Seta Ki – Pura |
| සදා ලෙසින් නැගි වාහන ඇතෙ කී | Sada Lesin Negi Vahana Ethe Ki |
| බෙදා සිවුරඟින් පාබළ පෙළ කී – රඟ | Beda Sivurangin Pabala Pela Ki – Ranga |
| නදා හඬ ගිගුම් පසතුරු නොයෙ කී | Nada Handa Gigum Pasathuru Noye Ki |
| | |
| විදා යන ගමන් පුද පෙළහර කී – රජ | Vida Yana Gaman Puda Pelahara Ki – Raja |
| පුදා පෙර ගමන් රඟ සිවු සැට කී | Puda Pera Gaman Ranga Sivu Seta Ki |
| එදා ගරු සිතින් වැඩි පුර වරෙ කී – යෙදු | Eda Garu Sithin Vedi Pura Vare Ki – Yedu |
| උඩාර වන්නම පෙර මේ ලෙස කී | Udara Vannama Pera Mei Lesa Ki |

# MAYURA VANNAMA
## The Peacock

| | |
|---|---|
| සතර සිව්වර බලැති දිඩතර – සුරිඳුනේ කදිරා | *Satara Sivwara Balethi Didathara – Surindune Kadira* |
| කතරගම පුර සුරිඳු වාහන – කරති රණ මොනරා | *Kataragama Pura Surindu Vahana – Karathi Rana Monara* |
| පතර තෙද ගම්භිර සතට සෙත – වේල අවිය දරා | *Pathara Theda Gambira Sathata Setha – Vela Aviya Dara* |
| නොහැර ඉසිවර යෙදුව මෙම යුර – වර්ණ කර මයුරා | *Nohera Isiwara Yeduwa Mema Yura – Varna Kara Mayura* |

# THURANGA VANNAMA

## The Horse

| | |
|---|---|
| සත් වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු | Sath Veth Mahath Adara Lath Yuth Sidath Kumaru |
| ගත් සිත් තොසත් පැවිදි අංගා | Gath Sith Thosath Pevidi Anga |
| අන කරන ඡන්නයෙන කන්තකය අසු ගෙනෙන | Ana Karana Channayena Kanthakaya Asu Genena |
| ගෙන එදින අසුගෙ පිට නැංගා | Gena Edina Asuge Pita Nenga |
| ගත් පයත් අසුගෙ සබ්දත් වසත් සුරිඳු | Gath Payath Asuge Sabdath Wasath Surindu |
| යන්නෙන් තොසින් තිදෙන සමගා | Yannen Thosin Thidena Samaga |
| යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දැන | Yana Yanena Kala Thidena Ethena Thena Pasuwa Dena |
| ගංතෙරට පත්වුණිය එමගා | Gantherata Pathvuniya Emaga |
| ලත් සිතත් තිදෙන වෙත් එකත් පසව | Lath Sithath Thidena Veth Ekath Pasawa |
| මුත් කන්තකත් වේය තුරඟා | Muth Kanthakath Veya Thuranga |
| සිදුහතුන් ගෙන වහන ඡන්න වලිගය අතින | Siduhathun Gena Vahana Channa Valigaya Athina |
| පැන්නෙන් එතෙර අනොම ගංගා | Pennen Ethera Anoma Ganga |
| ගොත් සිත් මහත් රුසිරු ලත් යුත් සිදත් කුමරු | Goth Sith Mahath Rusiru Lath Yuth Sidath Kumaru |
| ගෙන් සෙත් රැගත් නෙර්ත අංගා | Gen Seth Regath Nertha Anga |
| තිදෙන පැන ගියෙ ගඟින එතෙද අණ ගෙන බැතින | Thidena Pena Giye Gangina Etheda Ana Gena Bethina |
| යෙදුව නැණ වර්ණයෙන තුරඟා | Yeduwa Nena Varnayena Thuranga |

**KANDYAN DANCE III**
**The Open University | Open Create Learn**
**By Dilini Seneviratne**

# HANUMA VANNAMA
## The Monkey

| | |
|---|---|
| ගිරින් ගිරට පැන ලැගුම් සොය පුබුදමින් අරුණ කල මා | *Girin Girata Pena Legum Soya Pubudamin Aruna Kala Ma* |
| ගොර දෙමින් නැවත වට පිටින් බලති නෙක උහුළු විහිළු පුදුමා | *Gora Demin Newatha Wata Pitin Balathi Neka Uhulu Vihilu Puduma* |
| එයින් නැවත පල තුරින් තුරට පැන මලින් පලද දළු මා | *Eyin Newatha Pala Thurin Thurata Pena Malin Palada Dalu Ma* |
| අත දෙමින් රැගෙන කට කොනින් බුදිති වට පිටින් බියැති බැලුමා | *Atha Demin Regena Kata Konin Budithi Vata Pitin Biyethi Beluma* |
| දුටින් අයෙක් සට පටින් පැනුම් රැලි පොටින් නෙරා හෙවුමා | *Dutin Ayek Sata Patin Penum Reli Potin Nera Hewuma* |
| බය දුටින් එවිට අතු පතින් වසා මුව ඉතින් නැතැයි පෙනුමා | *Baya Dutin Evita Athu Pathin Wasa Muwa Ithin Nethei Penuma* |
| මතින් උඩඟු සිත ගතින් වැඩිව පෙර පැතුම් විලසටමමා | *Mathin Udangu Sitha Gathin Vediwa Pera Pethum Wilasatamama* |
| නැන යෙනින් මෙලෙස ඉසි මතින් යෙදුව පෙර මෙවන් වරුණ හනුම | *Nena Yenin Melesa Isi Mathin Yeduwa Pera Mewan Varuna Hanuma* |

**KANDYAN DANCE III**
**The Open University | Open Create Learn**
**By Dilini Seneviratne**

# URAGA VANNAMA
## The Reptile

| | |
|---|---|
| අනගා පුලින් ගතවේ…// | Anaga Pulin Gathawe…// |
| සුලඟා බොජුන් එවගා මැඩින් සමගා | Sulanga Bojun Evaga Medin Samaga |
| වෙරඟා ගිලුන් පොළඟා | Veranga Gilun Polanga |
| බඩගා යමින් පොළවේ…// | Badaga Yamin Polawe…// |
| සමගා උඩත් එළඟා සබෙත් තුළගා | Samaga Udath Elanga Sabeth Thulanga |
| බලමින් බිමත් සමගා | Balamin Bimath Samaga |
| එනඟා ගුලින් ගොඩවේ…// | Enanga Gulin Godawe…// |
| හැඩගා නොමින් සරඟා ගමන් එළඟා | Hedaga Nomin Saranga Gaman Elanga |
| පෙනගා විකුම් අගනා | Penaga Vikum Agana |
| උරගා ගමන් යෙදුවේ…// | Uraga Gaman Yeduwe…// |
| නැණගා ඉසින් අගනා ලෙසින් ස්වරගා | Nenaga Isin Agana Lesin Svaraga |
| මෙරඟා වරුණ උරඟා | Meranga Varuna Uranga |

# UKUSA VANNAMA
## The Hawk

| | |
|---|---|
| මෝරා…… බිජයෙනා…… | Mora…… Bijayena…… |
| කලපත් දෙකඩත් කල සිත් තුටුවෙත්… | Kalapath Dekadath Kala Sith Thutuweth… |
| දෙන්නා…… ආදර තොසා | Denna …… Aadara Thosa |
| නෑරා…… තටු පතිනා…… | Nera…… Thatu Pathina…… |
| ලෙලවත් සොලවත් පියඹත් නද දෙත්…// | Lelawath Solawath Piyambath Nada Deth…// |
| යන්නා……. පවන රැසා | Yanna……. Pavana Resa |
| සාරා…… බොජුනයෙනා ……// | Sara…… Bojunayena……// |
| අයිරොත්පෙතියොත් තුඩගත් බුදිසිත් …// | Airoth Pethiyoth Thudagath Budisith…// |
| පැන්නා…… එජල රැසා …… | Penna…… Ejala Resa |
| බේරා……ඉසිහු දැනා……// | Bera……Isihu Dena……// |
| පවසත් මෙපවත් දැනසත් ලොවටත්…// | Pawasath Mepawath Denasath Lowatath…// |
| වන්නම…… නම් උකුසා | Vannama…… Nam Ukusa |

# SAVULA VANNAMA

## The Fowl

| | |
|---|---|
| සුරිඳුන් පෙර සිටන් – බලයුත් පැවති දුන් | Surindun Pera Sitan – Balayuth Pevathy Dun |
| සහ ගොස් කල යුදෙන් – අසු – රන් ජය නොලදින් | Saha Gos Kala Yuden – Asu – ran Jaya Noladin |
| බර අත් ගෙන කගින් – ඇන කොන්තවි වලින් | Bara Ath Gena Kagin – Ena Konthavi Valin |
| අසුරන් කල යුදෙන් – ජය – ගෙන කඳ කුමරුන් | Asuran Kala Yuden – Jaya – Gena Kanda Kumarun |
| ගසමින් කග පතින් – දෙපලුව අසුර සෙන් | Gasamin Kaga Pathin – Depaluwa Asura Sen |
| දැරුපා අතලුවෙන් – පලු – දෙක ගෙන සැනෙකින් | Derupa Athaluwen – Palu – Deka Gena Senekin |
| එම වන් පලුවකින් – එවුපන් සැනයකින් | Ema Wan Paluwakin – Evupan Senayakin |
| සවුලා නම එයින් – ලොව – පළ කල උපතින් | Savula Nama Eyin – Lowa – Pala Kala Upathin |

# KIRALA VANNAMA

## The Lapwing

| | |
|---|---|
| සන්න සොලෝ පෙළ – දන්න ලෙසින් උප – තින්න බලා සක ලා... | Sanna Solo Pela – Danna Lesin Upa – thinna Bala Saka laa… |
| ඉන්න තුරින් ඉගි – ලෙන්න තුරින් තුර – ගින්න බොජුන් සොය ලා... | Inna Thurin Igi – lenna Thurin Thura – Ginna Bojun Soya laa… |
| දන්න හඬින් තුඩ – ගින්න නැගුම් ස්වර – යෙන්න ඉසින් දැක ලා... | Danna Handin Thuda – Ginna Negum Swara – yenna Isin Deka laa… |
| ඔන්න මෙදැන් පව – සන්නෙ සිරින් යුතු – වන්නම මයි කිර ලා... | Onna Meden Pawa – sanne Sirin Yuthu – Vannamamai Kira laa… |

**KANDYAN DANCE III**
**The Open University | Open Create Learn**
**By Dilini Seneviratne**

## SINHARAJA VANNAMA
## The Lion

| | |
|---|---|
| පෙරත් කලෙක සිංහ රජෙක් වැටුනි මහ | Perath Kaleka Sinha Rajek Vetuni Maha |
| ලිදක් තුලෙක ඉබි ලඩෙක් කරපු වැඩ | Lindak Thuleka Ibi Ladek Karapu Veda |
| හැරත් මෙහෙම යස වැඩක් උනේ නැත | Herath Mehema Yasa Wedak Vune Netha |
| චිරත් කලක් පැවතුමක් යසඉ හැඩ | Chirath Kalak Pevathumak Yasai Heda |
| දුරත් බැලුම නොව ලඟත් බලන අය | Durath Beluma Nova Langath Balana Aya |
| හටත් එලෙස වෙයි කැටක් තබමි දඩ | Hatath Elesa Wei Ketak Thabami Dada |
| වටත් අයට දැනෙනටත් කියමි මම | Vatath Ayata Denenatath Kiyami Mama |
| රටක් වටින සිහ රජ වන්නමෙ හැඩ | Ratak Vatina Siha Raja Vanname Heda |

## EERADI VANNAMA
## The Arrow

| | |
|---|---|
| ඇන්න කඟ පලි යෙන්ද මුන අවි යෙන්ද කැට මුගු රින්ද වලතඩි | Aenna Kanga Pali yenda Muna Avi yenda Keta Mugu rinda Valathdi |
| දන්න නෙක තුර ගුන්ද අලි ඇතු ගෙන්ද බලපිරි සෙන්ද ගොරහැඩී | Danna Neka Thuran gunda Ali Ethu genda Balapiri Senda Gorahedi |
| දන්න සරඹ වැනුම්ද ගෙන එඩි යෙන්ද රජ මැරු වෙන්ද දිවි පොඩි | Danna Saramba Venu mda Gena Edi yenda Raja Meru venda Divi Podi |
| දුන්න සැර අවි යෙන්ද එබඳුල ඉන්ද්‍ර පඬි යෙදු වන්න ඊරඩී | Dunna Sera Avi yenda Abandula Indra Pandi Yedu Vanna Eeradi… |

# NAIYADI VANNAMA
## The Cobra

| | |
|---|---|
| ඉපිද එබෝසත් නාලොව වාරෙක | Ipida Ebosath Nalowa Vareka |
| පැහැද රකිති සිල් නරලොව වනයෙක | Peheda Rakithi Sil Naralowa Vanayeka |
| බොවද දෙමින් අල්වා අහිකුන්ඨික | Bowada Demin Alwa Ahikuntika |
| පැසක ලමින් නටවා දුක් දී නෙක | Pesaka Lamin Natawa Duk Dee Neka |
| අන්දමකින් ඉඳ පෙනය නගායේ | Andamakin Inda Penaya Nagaye |
| සන්දම මෙන් දැහැඩින් වකලායේ | Sandama Men Dehedin Wakalaye |
| රන්දම මෙන් ගත වටින් දිලීයේ | Randama Men Gatha Watin Dileeye |
| පන්දම ලෙස දන දී නටවායේ | Pandama Lesa Dana Dee Natawaye |
| බෝකොල අන්දම් පෙනය නගායේ | Bokola Andam Penaya Nagaye |
| නාකොළ අන්දම් පෙන හකුලායේ | Nakola Andam Pena Hakulaye |
| ලෝතුල රන්දම් සිරිනි දිගායේ | Lothula Randam Sirini Digaye |
| ඒ කුල සතරක් පෙරෙ සිට ආයේ | Ae Kula Satarak Pere Sita Aaye |
| දිගා සිරුැර කොටසක් හකුලා මුඩි | Diga Sirura Kotasak Hakula Mudi |
| නගා ගතය ලෙලවා කරමින් දැඩි | Naga Gathaya Lelawa Karamin Dedi |
| රඟා සිරින් සිඹිමින් නදයෙන් වැඩි | Ranga Sirin Simbimin Nadayen Vedi |
| වගා අසන් මෙම වන්නම නයියඩි | Vaga Asan Mema Vannama Naiyadi |

**KANDYAN DANCE III**
**The Open University | Open Create Learn**
**By Dilini Seneviratne**

# VAIRODI VANNAMA
## Emerald Stone

| | |
|---|---|
| අගය වඩන කවි වරුණා - රඟය දැනෙයි කල රචනා | Agaya Vadana Kavi Varuna - Rangaya Denei Kala Rachana |
| මට උරණා නොව මෙදිනා - මහතුගෙ අවසර …… රැගෙන සමාවා | Mata Urana Nova Medina - Mahathuge Awasara …… Regena Samawa |
| ඉසුරු දෙවිඳු වඩින දිනා - කෙහෙතු විමන දැක නෙතිනා | Isuru Devindu Wadina Dina - Kehethu Vimana Deka Nethina |
| එම විමනා දෙවි වඩිනා - කෙහෙතුද දැක කොයි …… වඩිති කමාවා | Ema Vimana Devi Vadina - Kehethuda Deka Koi …… Wadithi Kamawa |
| විමන සමග කෙහෙතු ගැනා - ඉසුරු දෙවිඳු තුති දෙමිනා | Vimana Samaga Kehethu Gena - Isuru Devindu Thuthi Demina |
| මෙම වරුණා කල යෙහෙනා - පාතල විරෝඩි වන්නම මේවා | Mema Varuna Kala Yehena - Paathala Vairodi Vannama Mewa |
| ඔබින මෙසබ තුල පැමිනා - කවිය නැතුව බොරු වරුණා | Obina Mesaba Thula Pemina - Kaviya Nethuwa Boru Varuna |
| කල දුදනා නැත ඔබිනා - උගතුගෙ බල වැඩි මොකද පමවා | Kala Dudana Netha Obina - Ugathuge Bala Wedi Mokada Pamawa |

# SURAPATHI VANNAMA
## Goddess Surapathi

| | |
|---|---|
| ශ්‍රියා මත්පති උමඟනා දෙව් – නැතිව විලි සෝකයෙන් ඉසුරිඳු…// | Shriya Mathpathi Umangana Dev – Nethiwa Vili Sokayen Isurindu..// |
| දෙ-වෙ-ස වෙ-ලා ග-තී…// | De-ve-sa We-la Ga-thi…// |
| කියා කොතැනද නැතිව දැනුමක් – සෙව්ව කල ලෙබුණා එ දෙව්දුව…// | Kiya Kothanada Nethiva Denumak – Sevva Kala Lebuna E Devduwa…// |
| තෝ-සා ම-නා රැ-තී…// | Tho-sa Ma-na Ru-thi…// |
| කියා රඟ නද තාලයෙන් වර් – ණයක් ගෙන හැර පෑව එසුරිඳු…// | Kiya Ranga Nada Thalayen Var – nayak Gena Hera Peva Esurindu…// |
| කේ-ස ස-රඹ නි-තී…// | Ke-sa Sar-amba Ni-thi…// |
| නයා වටකර දරන සුරිඳුගෙ – වර්ණයකි ගෙන පෑවු පරසිඳු…// | Naya Watakara Darana Surinduge – Varnayaki Gena Pevu Parasindu …// |
| වන්-නම සුර-ප-තී…// | Vann-ma Surapathi …… |

# GANAPATHI VANNAMA
## God Ganesha

| | |
|---|---|
| යුත් සිරින් බබලන – ඇත් හිසින් සසොබන | Yuth Sirin Babalana – Eth Hisin Sasobana |
| වෙත් දළින් අඩ දැන – ගනු සුදනා | Veth Dalin Ada Dena – Ganu Sudana |
| රත් පියුම් වැනි මුඛ – යුත් වසන් ලෙලදෙන | Rath Piyum Veni Mukha – Yuth Vasan Leladena |
| නෙත් අඳුන් නිල්මිණ – කුඹුර මනා | Neth Andun Nilmina – Kumbura Mana |
| අත් උරින් පහතින – වෙත් සුරන් සිරුරින | Ath Urin Pahathina – Veth Suran Sirurina |
| යුත් නිතින් දෙවඟන – දෙදෙනෙකි නා | Yuth Nithin Devagana – Dedeneki Na |
| ගත් නැණින් යුතු සුරිදෙක් බැවින් ඉසිදැන | Gath Nenin Yuthu Surindek Bevin Isidena |
| වෙත් මෙවන් ගනපති වන්නම් නා | Veth Mevan Ganapathi Vannam Na |